# බළන්ගොඩ නගර සභාව
## 2020-02-11 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.02.11**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-01-21 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2020-01-21 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයන්ගේ සංසඳය විසින් නගර සභා නගරාධිපතිවරුන් සඳහා නිල කබාය සහ නිළ පළඳනාව ලබා දී තිබෙන අතර සභාවේ ගෞරවය හා තනතුරේ ගෞරවය සඳහා මෙය වැදගත් බැවින් මෙම නිළ කබාය හා නිළ පළඳනාව ලබා දීම පිළිබඳව ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයන්ගේ සංසඳයට ස්තුතිය පළ කරන අතර මෙම නිළ කබාය හා නිළ පළඳනාව ලබා ගැනීම සඳහා මුදල් අනුමත කර ගෙවීම් කටයුතු සිදු කළ සියළු දෙනාට බළන්ගොඩ නගර සභාවේ සභාපති ලෙස තම ස්තුතිය පුද කරන ලදී.
- ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අසනීප තත්ත්වයේ පසුවන නිසා අද දින නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා ඇති බැවින් එතුමාගේ නිවාඩු අනුමත කරන බව පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ රථවාහන පොලිසීයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනානායක මහතාගේ විශ්‍රාම යෑම නිමිත්තෙන් එතුමා හට උපහාර උත්සවයක් පැවැත්වීම සඳහා 2020.02.15 වන දින බළන්ගොඩ නගර සභා ක්‍රීඩාංගණය ලබා දෙන ලෙස බළන්ගොඩ රියදුරු පාසල් හිමියන්ගේ සංගමය විසින් ඉල්ලා සිටින ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙහි සංවිධායක මණ්ඩලය සඳහා නීති රීති මාලාවක් පැනවීමෙන් අනතුරුව ලබා දීම සුදුසු බව පවසන ලදී.

- ටී.ඩී.එම්.ආර්.චන්ද්‍රරත්න මහතා විසින් පැරණි පොදු වෙළෙඳසැල තුළ පිහිටි අංක 04 දරණ කඩ කාමරය තමා වසර විස්සක පමණ කලක සිට කරගෙන ගිය නමුත් එහි වෙළෙඳාම නොමැති වීම හේතුවෙන් වසරක පමණ කලක සිට එම කඩ කාමරය වසා දමා ඇති අතර එහි හිඟ කඩ කුලී ගෙවීම සඳහා සහනයක් ලබා දෙන ලෙසත්, නව සති පොළෙන් ස්ථානයක් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සීමාව තුළ එළවළු කඩ විශාල වශයෙන් විවෘතව ඇති බැවින් කොපමණ කඩ ප්‍රමාණයක් පවතී ද යන්න විමසා එළවළු කඩ පිළිබඳ තොරතුරු ලැයිස්තුවක් ලබා ගන්නා ලෙස පවසන ලදී.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා වෙළෙඳපල සීමාවේ පවතින එළවලු කඩ පිළිබඳ තොරතුරු ලබා ගන්නා ලෙස පැවසීය.

  සතිපොළේ සුදුසු ස්ථානයක් පරීක්ෂා කර ලබා දීම සුදුසු බවත් නගරයේ සෑම තැනම එළවළු කඩ විවෘතව ඇති බැවින් ඒ පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතු බවත් සභාවේ මතය විය.

- පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ACLG 04 /08 හා 2020-01-28 දිනැතිව යොමු කරන ලද “රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය” යන ලිපිය මඟින් මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 7/2019 ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදුව මෙම සභාවට කසළ කළමනාකරණය සඳහා සුදුසු වාහනයක් ලබා ගැනීමට පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත්, මෙම සභාවේ පැවැත්වෙන ඉදිරි කර්මාන්ත කමිටුවේදී වාහනය සඳහා මිළ ගණන් ඉදිරිපත් කර තිබූ Ideal Motors ආයතනයේ නියෝජිත මහතෙකු ගෙන්වා එම වාහනය පිළිබඳ තොරතුරු ලබාගෙන අනුමැතිය සඳහා ඉදිරි මහ සභාවට යොමු කර ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත් සභාවේ මතය විය.

***ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා***

- වෘත්තීය දේශකවරුන්ගේ සංගමය විසින් බළන්ගොඩ නගර සභාව විසින් පාලනය කරන ප්‍රචාරක දැන්වීම් පුවරු පසුගිය කාලයේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව ඇතැම් ආයතන හා පුද්ගලයින්ට ලබා දී ඇති බැවින් අනෙකුත් ආයතන හා ගුරුවරුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත්, එසේ ලබා දී ඇති එම දැන්වීම් පුවරු නැවත වරක් ටෙන්ඩර් ක්‍රියාපාටිපාටියක් යටතේ ලබාදෙන ලෙසත් පවසා එවූ ලිපිය සභාගත කරන ලදී.

  ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සභාව මඟින් ටෙන්ඩර් කර ඇති පුවරු ප්‍රමාණය නිසි පරිදි ටෙන්ඩර් කර ඇති අතර, GSR ආයතනය සඳහා ලබා දී ඇති දැන්වීම් පුවරු ගැසට් කර ඇති මිල ප්‍රමාණයන්ට අනුව ලබා දී ඇති බව පැවසීය. එමෙන්ම අප සභාව සඳහා පුවරු අලෙවි කර ආදායම් ලබා ගැනීමේ ක්‍රමවේදය හඳුන්වා දී ඇත්තේ GSR ආයතනය වන බැවින් ද අප

සභාවෙන් සමාජය වෙත ලබා දෙන ඉතා වැදගත් පණිවිඩයන් එම පුවරු තුලින් ප්‍රදර්ශනය කර ඇති නිසාවෙන් ද සභාව වෙත ලැබෙන මහජන ප්‍රසාදය හා එම පණිවිඩ තුළින් සමාජය දැනුවත් වීම සිදුවන බව ද වැඩිදුරටත් පවසන ලදී. එමෙන්ම කුඩා දැන්වීම් පුවරු සියල්ල ඉවත් කර අඩි 10X20 වන සේ දැන්වීම් පුවරු තනා එක් ආයතනයකට එකක් වන සේ ලබා දීමට කටයුතු කරන බවද පවසන ලදී.

***ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා***

තුඹගොඩ ශ්‍රී සාංඝික මහ සුදර්ශනාරාමයේ විහාර භූමිය මැදින් ඉදිකර ඇති කසල කාණුව ඉවත් කර එය කඩවීදිය පිටුපස පන්සල භූමියේ වැට අයිනෙන් දුර්ගන්ධය පරිසරයට වහනය නොවන අයුරින් කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් විකල්පයක් යොදා සකස් කර දෙන ලෙස විහාරස්ථ දායක සභාව විසින් ඉල්ලා තිබූ ලිපිය සභාගත කරන ලදී.

***ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා***

- අංක 64/7, කරව්කැටිය පාර, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඒ.එම්.අමීර් මරික්කාර් මහතාගේ නිවසට අනතුරුදායක ලෙස පිහිටා ඇති කොස් ගස් දෙක හැකි විගසින් කපා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති ලිපිය සභාගත කරන ලදී.

- බළන්ගොඩ වසමෙහි වැකුඹුරගම, තුන්වන පටුමග නගර සභාව වෙත පවරා සංවර්ධනය කර දෙන ලෙස වැ කුඹුර ප්‍රදේශවාසීන් විසින් කර ඇති ඉල්ලීම ගරු සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

මෙදින සභාවේ ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම් කිසිවක් නොතිබුණි.

**05. කල් දී ඇති යෝජනා**

**05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

05ඃ01ඃ01 වීථි පහන් කටයුතු සඳහා 30W CFL බල්බ් 200 ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

වීථි පහන් කටයුතු සඳහා 30W CFL බල්බ් 200 ක් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් විදුලිබල මණ්ඩලය මගින් එම විදුලි පහන් ඉවත් කරන නිසා අනවශ්‍ය වියදමක් දැරීමට සිදුවන බැවින් අලුතින් වීථි ලාම්පු සවි නොකරන ලෙසත්, වීථි පහන් නඩත්තුව පමණක් සිදු කරන ලෙසත් පවසන ලදී. එමෙන්ම දීර්ඝ කාලයක සිට සවිකර තිබූ විදුලි බල්බ ගලවා ගෙන ගිය අතර

කල්තොට පාරේ අවශ්‍ය නොවන පරිදි වීථි පහන් සවිකර ඇති බවද එසේ විදුලි පහන් සවි කිරීමේ දී ගරු සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස ද එසේ දැනුවත් නොකර නව විදුලි පහන් සවි කළහොත් විදුලි බල මණ්ඩලය වෙත තමන් දැනුවත් කරන බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා සභාව සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී කමිටුවක් හරහා සිදු කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ02 කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය හා බැංකියවත්ත සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ03 ආර්.කේ.ජයතිස්ස මහතා විසින් වැසිකිළි සඳහා තබා ඇති රු.210,306.52 ක ඇප මුදල් ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ04 කම්කරුවන් හා රියදුරන් සඳහා අවශ්‍ය වැහි කබා 25 ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ05 දොරවෙල බුදු මැදුර ඉදිරිපිට "වාහන නවතා තැබීම තහනම්" යනුවෙන් නාම පුවරුවක් සවි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05։01։06 ටයර් ගෙන්වා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ටයර් වර්ගය | ප්‍රමාණය |
|---|---|
| 600X16 | 08 |
| 660X15 | 14 |
| 700X15 | 04 |
| 650X16 | 10 |
| 700X16 | 12 |
| 14X17.5 | 02 |
| 13.6X28 | 02 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05։01։07 සභාව සතු වාහන වල අදාළ මීටර් පැය ගණන සම්පූර්ණ වූ පසු අර්ධ සේවා/පූර්ණ සේවා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05։01։08 HF 7899 දරණ JCB යන්ත්‍රය හා UQ 1933 දරණ මෝටර් බයිසිකලය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05։01։09 බස්නැවතුම්පල ඩී-11 දරණ කඩ කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙහි වර්ථමාන බදුකරු වන යූ.ජී.ගුණසේකර මහතා විසින් කේ.පී.රුවන් චතුරංග යන අය වෙත අතුරු බදු ලබා දී ඇති බව

අනාවරණය වී ඇති අතර මෙම කඩ කාමරය සඳහා කී මනි මුදලක් ලබා ගෙන නොමැති බැවින් ප.පා.කො.චක්‍රලේඛ 01/2009 ප්‍රකාරව කටයුතු කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී. එබැවින් වර්තමාන තක්සේරු මුදල මත පදනම්ව කීමනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇතිව අතුරු බදුකරු වන කේ.පී.රුවන් චතුරංග යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥10 නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා රු.71,200.00 ක් වටිනා බෙහෙත් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥11 ආපදා ණය ලබා ගැනීම -සංවර්ධන නිළධාරී මදූෂාණි ආනන්ද මිය - රු. 250,000.00

සංවර්ධන නිළධාරි අනූෂා මල්කාන්ති මිය - රු.250,000.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፥01፥12 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:13 ගරු සභාපතිතුමා සඳහා මාසිකව රු.5,000.00 ක්, උප සභාපතිතුමා සඳහා රු.4,000.00 ක මුදලක් හා නාගරික මන්ත්‍රීවරුන් සඳහා මාසිකව රු.3,000.00 ක දුරකථන දීමනාවක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:14 2020 වර්ෂය තුළ වටරවුම් අලුත්වැඩියාව හා නඩත්තුව සිදු කිරීම සඳහා සුදුසු මූල්‍ය ආයතනයක් හඳුනා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් අදාළ මූල්‍ය ආයතනය විසින් නාම පුවරු පමණක් සවිකර නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා නගරයට පිවිසෙන ස්ථානයේ අලංකාරය නොමැති වන බැවින් තමන් එයට අකමැති බව පවසන ලදී. එබැවින් නගර සභාව විසින් විධිමත් සැලසුමක් සකස් කර එයට ගැලපෙන පරිදි ලබා දීම සිදු කළ යුතු බව පවසන ලදී.

05:01:15 227-5020 ගලි බවුසරයේ ස්පීඩ් මීටරයක් අලුතින් දැමීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:16 පුස්තකාලය සඳහා Epson TMU-220D Pos (Dot Matrix) Printer එකක් මිළදී ගැනිම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.-රු.28,900.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ17 සභාවේ සේවය කරන ස්ථිර නොවන සේවකයින්ගේ සේවා අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් අය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ18 රු.10,000ට වැඩි ගෙවීම් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

- බොබ් කැට් යන්ත්‍රයට අවශ්‍ය Stud, Nut 05 බැගින් මිළදී ගැනීම - රු.20,595.60
- JD 4684 යතුරු පැදිය අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම වෙනුවෙන් ඉන්දික මෝටර්ස් වෙත රු.17,530.00 ක මුදලක් ගෙවීම
- GK 6227 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය සඳහා රු.15,705 ක මුදලක් ගෙවීම
- ZA -9835 හා ZA 5326 වාහන 2020 වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් රක්ෂණය කිරීමට හා එම රක්ෂණ ගාස්තු වශයෙන් 192,807.19 මුදලක් ගෙවීම.
- විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම - රු.14,109.01
- පුවත්පත් මිළදී ගැනීම වෙනුවෙන් ජිනසිරි සහෝදරයෝ වෙළෙඳසැල සඳහා රු.15,130.00 ක මුදලක් ගෙවීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ19 රු.10,000ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.**

- බොබ් කැට් යන්ත්‍රය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් Dax Engineering Pvt Ltd වෙත රු.128,611.90 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- 2020 ජනවාරි මස ඉන්ධන බිල්පත් පියවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- ගිණුම් අංශයේ 192.168.8.38 දරණ පරිගණකය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.36,750.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- ගරු ආණ්ඩුකාරතුමා බළන්ගොඩ පැමිණි දින වියදම් වූ ආහාර බිල් සඳහා රු.10,500.00 මුදලක් නටාෂා ෆුඩ් කැබින් වෙත හා රු.27,900.00 ක මුදලක් විශ්මි ෆුඩ් කැබින් වෙත ගෙවීම.
- 2020 වර්ෂයට සභාව සතු වාහන රක්ෂණය කිරීම වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත රු.360,530.30 ක මුදලක් ගෙවීම.

- දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ දෙවන කොටස වෙනුවෙන් රු.634,467.23 ක මුදලක් ශ්‍රී මුතු සුභ සාධක සමිතිය වෙනුවෙන් ගෙවීම.
- 2019 වර්ෂයේ එකතු කළ අගය මත බදු වශයෙන් රු.21,483.00 ක මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීම.
- දසමස් වැටුප් අත්තිකාරම් වශයෙන් රු.178,072.00 ක මුදලක් නිශාන්ත ගුරුගේ මහතා වෙත ගෙවීම.
- දසමස් වැටුප් අත්තිකාරම් වශයෙන් රු.250,000.00 ක මුදලක් අතුල කීර්ති ප්‍රියංකර මහතා වෙත ගෙවීම.
- කියවීම් ශාලාව සඳහා පුවත්පත් සැපයීම වෙනුවෙන් රු.15,840.00 ක මුදලක් ජිනසිරි සහෝදරයෝ වෙත ගෙවීම.
- වැලිහරනාව කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා වූ අවසන් බිල්පත ලෙස රු.38,294.74 ක මුදලක් කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීම.
- ඡායා පිටපත් යන්ත්‍රය මිළදී ගැනීම වෙනුවෙන් රු.280,775.00 ක මුදලක් Nec Technology වෙත ගෙවීම.
- 2020 වර්ෂයේ ජනවාරි මස පොදු වෙළෙඳසැල, මහජන පොළ, මුර කුටිය (පොළ), පොළ වැසිකිළිය, දොරවෙල ගබඩාව, පොළ ආපන ශාලාව සඳහා විදුලි බිල වශයෙන් රු.22,082.80 මුදලක් ගෙවීම.
- 2020 ජනවාරි මස කාර්යාලය, නගර සභාවට යාබද ගොඩනැගිල්ල, හෝරා ස්ථම්භය විදුලි බිල ලෙස රු.40,216.60 ක මුදලක් ගෙවීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා දෙහිගස්තලාව කුමාරගම මාර්ගයේ දෙවන කොටස ඉදි කිරීමේ දී හොඳ නිමාවකින් තොරව ඉදි කර ඇති බව පවසන ලදී.

05꞉01꞉20 රු.27,283,990.52 ක මුදලක් විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂයෙන් කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴21 ගරු සභාපතිතුමාගේ මාසික සභික දීමනාවෙන් ජේ.එල්.රොහාන් පිලීසියන් සිල්වා මහතාගේ හිඟ වරිපනම් පියවීම සඳහා රු.1,000.00 ක මුදලක් ජනවාරි මස අය කළ අතර එය ආදායමින් ආපසු ගෙවීමක් ලෙස නැවත ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴22 බොඩිලයින් පුද්ගලික සමාගමේ වාර්ෂික ගිණි ආවරණ සහතිකය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05෴01෴23 මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය මත අනවසර නොවන ආකාරයට ඕළුගංතොට රෝහල අසල පදික කඩ ඉදිකර පදික වෙළෙදාමේ නිරත වූ වෙළෙන්ඳන් හට මාසික කුලී පදනම මත ලබා දීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම කඩ කාමර පදවගෙන යා හැකි කරත්ත ලෙස සකස් කරන බවත් මෙම ස්ථානයේ මීට පෙර පදික වෙළෙදාම සිදු කළ වෙළෙන්ඳන් සඳහාම ලබා දෙන බවත් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම කඩ කාමර ඉදි කර ලබා දෙන්නේ කෙසේදැයි විමසූ අතර මෙම කඩ කාමර පැවරිය නොහැකි බව අදාළ අයට දැනුම්දෙන ලෙස පවසන ලදී. එමෙන්ම මෙම කඩ ලබා දීමේදී අදාළ වෙළෙන්ඳන් සභාවට කැඳවා ගරු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කර ලබා දීම සුදුසු බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ප්‍රමුඛතා ගත කර වැඩිම වසර ගණනක් වෙළෙඳාම් සිදු කළ වෙළෙන්ඳන් සඳහා පළමුව කඩ කාමර ලබා දෙන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා තමන් මෙම කාර්යයට විරුද්ධ බවත් ඕලුගංතොට පදික කඩ ඉවත් කර සභාපතිතුමා හොඳ දෙයක් කළ බවත්, පදික වෙළෙන්ඳන්

අසරණ වන බවට පවසන්නේ නම් පදික කඩ ඉවත් කරන අවස්ථාවේදීම තීන්දුවක් ගත යුතුව තිබූ බවත් පවසන ලදී. අවශ්‍ය නම් බෙදීමකට වුවද යා හැකි බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගරයේ පදික වෙළෙඳම් කටයුතු නතර කර තිබෙන අවස්ථාවකදී නගර සීමාවේම පිහිටා ඇති ඕලුගංතොට ප්‍රදේශයේ නැවත පදික වෙළෙඳාම සඳහා අවසර ලබා දීම අසාධාරණ බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් පදික වෙළෙඳාම සිදු කිරීම නිසා ඉවත් කළ වෙළෙන්ඳන් සඳහා මෙසේ ස්ථානයක් සකස් කර ලබා දීමට තමන් විරෝධතාවයක් නොදක්වන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පදික කඩ රෝහල අසළ ඉදි නොකර කිරිහල අසළ වෙනත් ස්ථානයක ඉදි කරන ලෙසත් ස්ථිර නොවන ආකාරයට ඉදි කරන ලෙසත් පවසන ලදී.

මේ පිළිබඳ මත දෙකක් පළවූ බැවින් බෙදීමක් සඳහා යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා රෝහළ අසළ පදික කඩ ඉදි නොකරන අතර කිරිහළ අසළ කුඩා ඉඩ ප්‍රමාණයේ පදික කඩ ඉදිකරන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05፡01፡24 මොහාන් සාලිය එල්ලාවල මාවතෙහි සූර්ය කෝෂ මඟින් ක්‍රියාත්මක වන වීථි පහන් පද්ධතියක් සවි කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ප.ව.12.51 ට පමණ ගරු සභාපතිතුමා හදිසි කටයුත්තක් සඳහා සභාවෙන් පිටව යාමෙන් අනතුරුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් මූලාසනය මෙහෙයවන ලදී.

05:01:25 ළමා උද්‍යානයට සූර්ය කෝෂ මඟින් ක්‍රියාත්මක වන විදුලි ආලෝක පද්ධතියක් සවි කිරීම.

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:26 තුඹගොඩ සඳුන්ගම මාර්ගයේ නවීන් විජේරිය මහතාගේ නිවස අසළ බෝක්කුව ඉදි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

5:01:27 2020 පෙබරවාරි 12 සිට මාර්තු 09 දක්වා කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

**කර්මාන්ත**

01.බැංකියවත්ත ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීම.
02.සුදර්ශන ගම මාර්ගය ඉහළ කොටස තාර දමා නඩත්තු කිරීම.
03.ඇල්ෆාවත්ත මාර්ගය මුල කොටස තාර දමා සංවර්ධනය කිරීම.
04.දංගමුව වලව්ව මාර්ගය කාණුව සකස් කර තාර දමා නඩත්තු කිරීම.
05.පොළ භූමියේ වැසිකිළිය සඳහා ළිඳක් ඉදි කිරීම.
06.පල්ලෙකුඹුර මාර්ගයේ දෙපස කැළේ කැපීම.

**අවශ්‍ය ද්‍රව්‍ය**

| | | |
|---|---|---|
| තාර බැරල් | - | 30 |
| 1 1/2 ගල් කියුබ් | - | 15 |
| 3/4 ගල් කියුබ් | - | 05 |
| චිප් ගල් කියුබ් | - | 10 |
| දර යාර | - | 30 |

**අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

කර්මාන්ත නඩත්තු කටයුතු සඳහා දෛනිකව සේවකයින් 15කගේ සේවය මිළදී ගැනීම

**රථ වාහන**

| | | |
|---|---|---|
| ටිපර් රථය | - | දින 25 |
| ට්‍රැක්ටර් රථය | - | දින 25 |
| D/D රෝල | - | දින 15 |
| JCB යන්ත්‍රය | - | පැය 20 |

ඉහත යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ඉහත කර්මාන්ත අතුරින් ඇල්ෆාවත්ත මාර්ගයට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා ඇල්ෆාවත්ත මාර්ගයට ප්‍රමුඛස්ථානය ලබා දෙන ලෙසත් ඉතිරි කර්මාන්ත සියල්ල අදාළ කාල සීමාව තුළ ඉටු කරන ලෙසත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:27 සභාවේ දැක්ම වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

මෙහිදී අදහස් දක්වන ගරු උප සභාපතිතුමා සභාවේ දැක්ම වෙනස් කිරීම සඳහා අවශ්‍ය යෝජනා ලබන සභා වාරයට ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් මෙදින මහ සභාව සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් 2020 වර්ෂයේ අයවැය මඟින් ලබා දෙන රු.300,000.00 ක යෝජනා වලට අමතරව 2019 වසරේ මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලබා දෙන බව පැවසූ රු.500,000.00 සඳහා ද යෝජනා ලබා දී ඇති නිසා එම මුදල් මෙම වසරේදී ලබා ගත හැකිද යන්න ගණකාධිකාරිතුමාගෙන් විමසිය යුතු බව පවසන ලදී. නමුත් අද දින ගරු සභාපතිතුමා ද ගණකාධිකාරිතුමා ද සභාවේ නොමැති බැවින් මෙම යෝජනා සියල්ල නැවත වරක් කර්මාන්ත කමිටුව සඳහා යොමුකර ඉටු කිරීමට හැකි කර්මාන්ත සඳහා පමණක් ලබන සභා වාරයේදී ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනිම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී රවින්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා 2020 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලබාදෙන රු.300,000.00 සඳහා ලබා දී ඇති යෝජනා හෝ අනුමත කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මාසික මහ සභාව මසකට එක් වරක් පමණක් පැවැත්වෙන අතර මහජනතාව වෙනුවෙන් කථා කිරීමට හෝ ඇත්තේ

එපමණ කාලයක් පමණක් බවද නිළධාරින් නොමැති දිනවල සභාව පැවැත්වීමට තමන් විරුද්ධ බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අද දින මන්ත්‍රීවරුන්ගේ යෝජනා වශයෙන් රුපියල් ලක්ෂ 120 ක පමණ යෝජනා ඉදිරිපත් කර ඇති අතර ගරු සභාපතිතුමාට මෙම යෝජනා අනුමත කිරීම සඳහා බලය තිබුණ ද මෙය සැලසුම් සහගත වියදමක් නොවන බැවින් මෙම යෝජනා අනුමත කර ගැනීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීම සුදුසු නොවේද යන්න විමසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් මේ පිළිබඳ ගැටලුවක් පවතින අතර 2020 අයවැය මගින් මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රුපියල් 300,000.00 ක මුදලක් පමණක් ලබා දී ඇති නමුත් ගිය වසරේ මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ලබා දෙන බව පැවසූ රුපියල් 500,000.00 ක යෝජනා මෙම වසරේ ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් පවතී ද යන්න සම්බන්ධව නිසි උපදෙස් ලබා ගත යුතු බව ද පැවසීය. එබැවින් ලබන සභා වාරය සඳහා මෙම යෝජනා සියල්ල යොමු කර සුදුසු තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා මෙම යෝජනා සියල්ල සභා දෙකකට යොමු කළ අතර නැවත වරක් ලබන සභාවට ද යොමු කළහොත් තවත් කාලයක් ගත වන බැවින් මෙම සභාවෙන් තීන්දුවක් ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

මන්ත්‍රීවරුන් යෝජනා ලබා දී තිබේනම් සභාවේ මුදල් තිබේනම් මෙම යෝජනා ක්‍රියාත්මක නොකිරීමට හේතුව කුමක්දැයි ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් විමසන ලදී.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් අද දින ඉටු කළ නොහැකි කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ ප්‍රයෝජනයක් නොමැති බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනා සම්මත කර ගැනීම සඳහා විශේෂ මහ සභාවක් පැවැත්වීම සුදුසු බව යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

**06. හදිසි යෝජනා**

**06ඃ01ඃ01 අප්‍රේල් මස මහ සභාව පැවැත්වීමේ දිනය තීරණය කිරීම.**

අප්‍රේල් මස මහ සභාව පැවැත්වීමේ දිනය තීරණය කිරීමේ යෝජනාව ගරු උප සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා අප්‍රේල් මස දෙවන අඟහරුවාදා අප්‍රේල් 14 වන බැවින් වෙනත් දිනයක් නම් කළ යුතුව ඇති බව පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අප්‍රේල් මස පළමු සතියේ පැවැත්වීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06ඃ01ඃ02 වැවේවත්ත පෙර පාසල අලුත්වැඩියා කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

වැවේවත්ත පෙර පාසල අලුත්වැඩියා කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු උප සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් අදාළ අලුත්වැඩියා සඳහා මිළ ගණන් කැඳවා ලබන සභා වාරය සඳහා ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2020.02.05 දින පැවති කර්මාන්ත කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **14,093,085.78** |
| වෙනත් ලැබීම් | **1,721,785.15** |
| මුලු ලැබීම් | **15,814,870.93** |
| පුනරාවර්තන වියදම් | **6,271,903.69** |
| වෙනත් වියදම් | **5,805,657.37** |
| මුලු වියදම් | **12,077,561.06** |

2020-01-01- සිට 2020-01-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 6,240.00 |
| 227-5020 | 57,550.08 |
| | 538.00 |
| 37-7933 | 3,120.00 |
| RD - 8240 | 24,960.00 |
| 56-1906 | 10,400.00 |
| BC-0005 | 31,200.00 |
| GC 0001 | 12,460.00 |
| | 538.00 |
| DPP0006 | 3,285.00 |
| DDR 0008 | 5,720.00 |
| HF - 8558 | 18,756.00 |
| | |
| OV/M 0017 | 1,897.00 |
| | 830.00 |
| GK-1483 | 5,200.00 |
| GK-6227 | 18,756.00 |
| | 795.00 |
| JD-4684 | 3,383.90 |
| LL-2110 | 837.00 |
| ND-5124 | 26,000.00 |
| PF-4006 | 27,588.00 |
| QL-2901 | 4,384.00 |
| RC-1107 | 29,915.00 |
| RB-4786 | 8,858.00 |
| RC-8183 | 26,538.00 |
| RE-2600 | 26,538.00 |
| UQ - 1933 | 4,110.00 |
| RD-8000 | 6,240.00 |
| SDRR 0013 | 5,200.00 |

| | |
|---|---|
| YG-0758 | 2,055.00 |
| ZA 9835 | 10,950.00 |
| ZA - 5039 | 18,720.00 |
| **එකතුව** | **403,561.98** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් 2020 අයවැය ලේඛනය තුළ එකම යෝජනාව විවිධ අදහස් ඇතිව මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකු විසින් ඉදිරිපත් කර තිබීම නිසා යෝජනා වැඩි ප්‍රමාණයක් අයවැය ලේඛන තුළ ඇතුලත් කිරීමට සිදු වී ඇති බැවින් නිලධාරීන්ගේ කාලය වැඩිපුර වැය වීමත් වැඩි පිටු සංඛ්‍යාවකින් අයවැය ලේඛනය යුක්ත වීමත් දක්නට ඇති බව පැවසීය. එමෙන්ම සමහර අවසන් කරන ලද කර්මාන්ත ද මෙහි ඇතුළත් කර ඇති බව පවසන ලදී.

මෙහිදි අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා, පාලන බල වෙනස් වීමත් සමඟ මහජනතාව ආණ්ඩු බලය තිබෙන මන්ත්‍රීතුමා සමඟ හෝ පවසා අදාළ කාර්යයන් ඉටු කර ගැනීමට සිතා කොට්ඨාශයක සිටින අනික් මන්ත්‍රීවරයාට ද යෝජනා ලබා දෙන බැවින් මෙසේ එකම යෝජනාව සටහන් වී ඇති බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

පොදුවෙළෙඳසැල පිටුපස කාණු පද්ධතිය අපිරිසිදු බවත් එම කාණු පද්ධතියෙන් පිටවන අපද්‍රව්‍ය ගඟට ගලා බසින බවත් එම කාණු පද්ධතිය මාස දෙක තුනකට වරක් හෝ ශුද්ධ පවිත්‍ර කිරිම සුදුසු බවත් පවසන ලදී.

එමෙන්ම එගොඩ හුණුකුඹුර ප්‍රදේශයේ යූ. පී. ඊ ද සිල්වා මල්ශාලාව ඉදිරිපිට කුකුළන් විකුණන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර එමඟින් දුර්ගන්ධයක් හමන බව ද එසේ සතුන් වෙළෙඳාම් කිරීම සඳහා බලය තිබෙනවා ද එසේ විකිණීම සඳහා අවසර ලබා දුන්නේ කවදාද යන්න විමසූ

ගරු නාගරික මන්ත්‍රීතුමිය හුණුකුඹුර මාර්ගයේ බුදු මැදුර සඳහා විදුලිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සකසා දෙන ලෙස පැවසීය. එමෙන්ම 2019 වර්ෂය මුල් කාලයේ දී එගොඩ හුණුකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් වුවද සම්පූර්ණ මාර්ගය සංවර්ධනය නොකර පැති බැමි දෙකක් පමණක් ඉදි කළ බව ද එම මාර්ගය මේ වන විට ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති අතර එම මාර්ගය සකස් කරන තෙක් මාර්ගය තලා දෙන ලෙස හෝ ගම්වාසීන් ඉල්ලීමක් කළ බව ද පවසන ලදී.

හුණු කුඹුර කෝපිවත්ත මාර්ගයේ නාම පුවරුව යොදන ස්ථානයේ දැන්වීම් අලවන බැවින් එහි නාම පුවරුව යෙදීම පිළිබඳ සභා අනුමැතිය ලැබුණ ද මේ වන තෙක් එය ඉටු වී නොමැති බැවින් එය ඉටු කර දෙන ලෙස පැවසීය. එමෙන්ම පීරිස් මහතාගේ නඩුව සම්බන්ධව මහජනතාවගෙන් මහජන නියෝජිතයින්ට චෝදනා ලැබෙන බව ද සඳහන් කළ ගරු මන්ත්‍රීතුමිය ආණ්ඩුකාරතුමා විසින් පිළියම් යොදා තිබිය දීත් සභාව විසින් මේ වන තෙක් ඒ සඳහා ක්‍රියාමාර්ග නොගත්තේ ඇයි ද යන්නත් මෙතෙක් කාලයක් මානූෂිකව සභාවේ මේ පිළිබඳව කථා කළ බවත් පවසන ලදී

එමෙන්ම සුදර්ශනගම මාර්ගයේ නඩත්තුව ඉටු කරන ලෙසත්, ඒ පිළිබඳව කර්මාන්ත කමිටුවේ සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතු කාරණයක් වන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ප.ව.1.58 ට පමණ සභාවෙන් පිටව යන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

බළන්ගොඩ නගරයට මරණ පරීක්ෂකවරයෙක් නොමැතිවීම ගැටලුවක් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය බළන්ගොඩ නගර සභා කොට්ඨාශ දහයෙහිම ශිෂ්‍යත්ව සමත් දරුවන් අතරින් දුප්පත් දරුවන් බොහොමයක් සිටින බැවින් එම කොට්ඨාශයකින් දරුවන් කිහිපදෙනෙකු සඳහා ශිෂ්‍යත්ව ලබා දීම සුදුසු බව ද කරවිකැටිය ගල්වල මාර්ගය මේ වන විට අබලන් වී ඇති බැවින් එය ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා බළන්ගොඩ නගරයට මරණ පරීක්ෂකවරයෙකු ලබා ගැනීම පිළිබඳව බළන්ගොඩ ආසන සංවිධායක තලතා අතුකෝරළ මැතිතුමිය වසර හතරක් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමති වශයෙන් සිටියදී එතුමියගෙන් ද සභාවේ

අනුමත කර ඉල්ලීමක් සිදු කළ නමුත් එය ඉටු නොවූ අතර ශිෂ්‍යාධාර නීත්‍යානුකූලව එසේ ලබා දිය නොහැකි බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය සභාවේදී සාකච්ඡා කර අනුමත කර ගත් පොදු වෙළෙඳසැල එළවළු කඩ සඳහා 50% කින් ගාස්තුව අඩු කිරීම සඳහා වන සභා තීරණය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර තිබේද යන්න විමසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

කරවිකැටිය ගල්වල මාර්ගය බොහෝ පිරිසක් භාවිත කරන අතර එය ඉක්මනින් සංවර්ධනය කළහොත් අඩු වියදමකින් කළ හැකි බව ද තමන් කර්මාන්ත කමිටුව වෙත ලබා දුන් යෝජනා සියල්ල නිර්දේශ කිරීම පිළිබඳ කර්මාන්ත කමිටුව් සභාපතිතුමාට ස්තුතිය පළ කරන බව ද පවසන ලදී

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා හදිසි රාජකාරි ලෙස සභාවෙන් පිට වූ විට ගරු උප සභාපතිතුමා යෝජනා කල් දැමීම තමන් අනුමත නොකරන බව ද තමන් උප සභාපති වශයෙන් සිටි සමයේදී සභාපතිතුමා නොමැති කාලය තුල ගත යුතු සියලු තීරණ ගත් බවද පැවසීය. නමුත් අද දින සභාවේ පවතින ව්‍යාකූලතාවය නිසා ගරු උප සභාපතිතුමාට එසේ කළ නොහැකි බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා පාර්ලිමන්ට් ජෝක්ස් වගේ බළන්ගොඩ නගර සභා ජෝක්ස් බැලීමට සිදු වී ඇති බවද ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා සමඟ මෙන්ම පක්ෂයේ අය සමඟ ද සම්බන්ධ නොමැති නිසා සභාව තුළ විවිධ ප්‍රශ්න පැන නැගී ඇති බැවින් එසේ වැඩ කිරීමේ හැකියාවක් නොමැති බවද සඳහන් කළේය.

පසුගිය කාල වකවානුවට වඩා මුදල් ප්‍රමාණයක් මේ වන විට සභාව වෙත ලැබී ඇති බව ද පවතින අර්බුදය සමඟ ගරු සභාපතිතුමාට ඉදිරියට යා නොහැකි බවද ගරු සභාපතිතුමා කාර්යක්ෂමව වැඩ කරන බවක් පෙනෙන්නට නොමැති බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා තමන් පත්කර මෙම ස්ථානය වෙත එවූ මහජනතාව පිළිබඳ තමන් දුක් වන බවද විශාල සංවර්ධන කොටසක් කිරීමට හා මහජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ලබා ගැනීම සඳහා මෙම

ස්ථානය වෙත පැමිණි බැවින් මහජන නියෝජිතයින් වශයෙන් අසරණ වී ඇති බව ද මහජන නියෝජිතයින් නොමැති වුවද නිළධාරීන් අවශ්‍ය කටයුතු සභාවේ සිදුකරමින් ගිය බව ද පැවසීය. නමුත් මහජනතාව මහජන නියෝජිතයින් පිළිබඳ අවධානයෙන් සිටින අතර කර්මාන්ත කමිටුවේ සභාපතිතුමා වඩා අවධානයෙන් කටයුතු කළ යුතු බව ද තම පක්ෂයේ ආණ්ඩුවක් පවතින නිසාත් සභාවේ බහුතරය තම පක්ෂය සතුව පවතින නිසාත් මහජනතාවට සේවය කිරීමේ හැකියාවක් පවතින බව ද පවසන ලදී.

නමුත් එසේ ඉටු කිරීමට බාධාවක් පවතින අතර එය තමන් වෙනුවෙන් ඡන්දය ලබා දුන් මහජනතාවට ගැටලුවක් බව ද තම පක්ෂයට මෙම සභාවේ බලය හා වගකීම ලබා දෙන්නේ නම් මහජනතාවට සේවයක් කළ හැකි බව ද කැබිනට් මණ්ඩලයේ ආණ්ඩුකාරතුමාගේ ජනාධිපතිතුමාගේ හා අගමැතිතුමාගේ සහයෝගය මෙම සභාව වෙත නොලැබී ඇති බව ද පවසන ලදී. එමෙන්ම තමන් ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා හමුවී 10km ක් මාර්ග සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන්කර ගනිමින් පැමිණි බවද සභාව පටන් ගත් දින සිට මේ දක්වා අසාර්ථක සභාවක් ලෙස දුටු බවද ගරු සභාපතිතුමා මේ පිළබඳව මීට වඩා සිතිය යුතු බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සභාවට මාසයකට දිනක් මෙලෙස පැමිණෙන්නේ ජනතාවට කුමක් හෝ දෙයක් ඉටු කිරීමට බලාපොරොත්තුවෙන් හා සිදු කළ දේ පිළිබඳ ප්‍රගතිය දැන ගැනීම සඳහා බව පවසන ලදී. සභාව පැවැත්වෙන දින සඳහා සභාව විසින් විශාල මුදලක් වැය කරන අතර එසේ වියදම් කර සභාව පවැත්වුව ද මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න සඳහා විසඳුම් ලබා ගැනීමට නොහැකිනම් සභාව පැවැත්වීමේ ප්‍රයෝජනයක් නොමැති බව පවසන ලදී. එබැවින් සභාව පැවැත්වෙන දිනයන්හිදී අවශ්‍ය නිළධාරීන් සභාවේ රඳවා ගන්නා ලෙස පවසන ලදී. එමෙන්ම ගරු සභිකයින් සඳහා දුරකථන දීමනාව රු.3,000.00 දක්වා වැඩි කිරීම පිළිබඳ සභා සම්මත වීම පිළිබඳ සතුටු වන බව පවසන ලදී. එසේම ශිෂ්‍යත්වය සමත් දරුවන් සඳහා ශිෂ්‍යත්වාධාර ලබා ගැනීමට අවශ්‍ය නම් සිංහ සමාජය සමඟ සම්බන්ධ වන ලෙස සුනේත්‍රා මැතිතුමියට පවසන ලදී.

එමෙන්ම බස්නැවතුම්පල සඳහා පින්තාලියක් ලබා දෙන ලෙස පසුගිය සභාවේදී ඉල්ලා සිටි අතර ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි කසළ එකතු කිරීම සඳහා Truck රථයක් ලබා

ගැනීමේ තත්ත්වය කුමක්දැයි විමසීය. ගුවන් පාලමෙන් බයිසිකල් ගොස් නව බස්නැවතුම්පලෙහි උඩ තට්ටුවේ නතර කරන බවත්, ලංකා බැංකුව අසළ මාර්ගය ලංකා බැංකු මාවත ලෙස නම් කරන ලෙසත් පදික වෙළෙඳුන් සඳහා ඉදිකළ කඩ කාමර 32 සඳහා විදුලි බල්බ සවිකිරීම හැකි විගසින් සිදු කරන ලෙසත් එසේ නොමැති වුවහොත් ඔවුන් නැවත පදික වෙළෙඳාම සිදු කල හැකි බවත් පවසන ලදී. එසේ පොරොන්දු වූ දෙය සිදු නොකර ඔවුන් ඉවත් කිරීම අසාධාරණ බව පවසන ලදී. බස්නැවතුම්පලෙහි බුලත් කෙළ ගසන අය සෙවීම සඳහා සී සී ටී වී කැමරා සවිකරන ලෙසත් සහරාන් සිද්ධියේදී පොලීසිය අසළ වසා දැමූ ගේට්ටුව අරින ලෙසත් සුනබ ගැටලුව සඳහා ඉක්මනින් විසඳුමක් ලබා දෙන ලෙසත් බළන්ගොඩ බලගහමුල ප්‍රදේශයේ ඇති හිස් කුඹුරු සංවර්ධනය කළ නොහැකි තත්ත්වයේ ඇති බැවින් එහි කණු මත කඩ කාමර ඉදි කරන ලෙසත් පවසන ලදී. බළන්ගොඩ ඩිපෝව වෙත නව බස්රථ ගෙන්වා ඇති බැවින් එහිදී ඉවත් කළ හොඳ තත්ත්වයේ පවතින බස්රථයක් වෙට්නෝල් පාර සඳහා යෙදීමට අවශ්‍ය ඉල්ලීම ඩිපෝව වෙත කරන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා සභාවේ ප්‍රශ්න ඉදිරිපත් කිරීම සඳහා සභාවේ නිළධාරීන් නොමැති වීම පිළිබඳ දැඩි විරෝධය පළ කරන ලදී. බළන්ගොඩ කතරගම කෝවිල අසළ විමල් හෝටලයෙහි පරිභෝජනයට නුසුදුසු ආහාර අලෙවි කරන බව නගරවාසීන් විසින් චෝදනා කරන බැවින් ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පොදු වැසිකිළි නඩත්තුව සභාව මඟින් ඉටු කිරීමේ දී තිබෙන ප්‍රගතිය කුමක්දැයි විමසූ අතර එයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, පොදු වැසිකිළි ටෙන්ඩර් කර සිදු කිරීමට වඩා ප්‍රගතියක් දැන් පවතින බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමාගෙන් යමක් විමසූ විට ගරු සභාපතිතුමා කිසිවක් නොදන්නා අතර එය නිළධාරීන්ගෙන් විමසන බව ද නිළධාරීන්ගෙන් විමසීමට නම් සභාපතිවරයෙක් අවශ්‍ය නොවන බව ද සභාව නොතිබූ කාලයේදී නිළධාරීන් සභාව හොඳින් කරගෙන ගිය බව ද සඳහන් කලේය. බස්නැවතුම්පළ ඉහළ මාලයේ වාහන නතර කිරීමට හේතුව වන්නේ රථවාහන නැවැත්වීම සඳහා තිබූ ස්ථානයේ පදික කඩ ඉදි කළ නිසා බවත් මෙතුළින් නව නගර සැලැස්ම සම්පූර්ණයෙන්ම වෙනස් වූ බවත් පවසන ලදී. අද

දින සභාවේ ගරු සභාපතිතුමා හා ගණකාධිකාරිතුමා නොසිටි බැවින් කිසිඳු තීරණයක් ගැනීමට නොහැකි වූ බවද වැඩිදුරටත් පැවසීය.

**10. අවසානය**

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම මෙම මස 17 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන බැවින් ඒ සඳහා යෝජනා තිබේනම් ගරු ලේකම්තුමිය වෙත ලබා දෙන ලෙස පවසන ලදී. හදිසි රාජකාරියක් සඳහා ගරු සභාපතිතුමා සභාවෙන් පිටව ගිය බැවින් තමන් වැඩ බලන සභාපති ලෙස පත්වූ බව ද බස්නැවතුම්පල සඳහා පින්තාලියක් ඉදිකිරීම අත්‍යවශ්‍ය බවද සභාවෙන් ගන්නා තීන්දු තීරණ සඳහා ඊළඟ සභාවට පැමිණෙන තෙක්ම පිළිතුරක් නොමැති බවද මේ ආකාරයට සභාව පවත්වාගෙන යාමෙන් බළන්ගොඩ නගර සභාවේ කීර්තිනාමයට හානියක් වන බව ද සඳහන් කළේය. නගර සභාව යනු ජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ගැනීම සඳහා පවතින ආයතනයක් වන අතර අද දින ගරු සභාපතිතුමා නොමැති වීම හේතුවෙන් තීන්දු තීරණ කිසිවක් ගැනීමට නොහැකි වූ බවත්, තමන් මෙහි තාවකාලිකව පමණක් සිටින බැවින් මෙහි වගකීම තමන්ට ගත නොහැකි බවත් පැවසීය. ගරු සභාපතිතුමා මේ පිළිබඳව සොයා බලා කටයුතු කළ බව ද හැමෝම එක්ව සහයෝගයෙන් ගමනක් යා යුතු බව ද සංවර්ධන කටයුතු මීට වඩා හොඳින් මහජනතාවට ලබාදිය යුතු බව ද පැවසූ අතර අද දින සභාවේ ලබාගත් තීන්දු පිළිබඳව සභාවෙන් පිටත කථා කිරීමට ද නොහැකි බවත් එනිසා සභාවේ මීට වඩා හොඳ සම්බන්ධතාවයක් පවත්වාගෙන යා යුතු බව ද පැවසීය. හදිසි අවස්ථාවකදී තමන් වෙත මූලාසනය ලබා දුන් අවස්ථාවේ දී සියලු දෙනා දැක්වූ සහයෝගය පිළිබඳ ස්තුතිවන්ත වන බව ද කිසිම හේතුවක් මත අත්‍යවශ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු ලබා නොදෙන ලෙසද ලබා ගන්නා තීන්දු තීරණ එම මාසයේදීම ක්‍රියාත්මක කළ හැකි වන ලෙස කටයුතු කරන ලෙසද වැඩිදුරටත් පවසන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.